# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 6 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 ඔක්තෝබර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1972 නොවැම්බර් මස 3 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 6 දරන මෝටර් ගමනාගමන
(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 ඔක්තෝබර් මස 23 වන දින]

එල්.ඩී.—ඕ. 22/71.

1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනත සංශෝධනය කිරීම
සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 6 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතෙහි 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතෙහි 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියෙහි (1961 අංක 22 දරන පනතින් එහි ඇතුළත් කරනු ලැබූ) (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියෙහි (4) වන උපවගන්තිය ඒ වගන්තියෙහි (3) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්.

**3.** මේ පනතෙහි 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරනු ලබන සංශෝධන ප්‍රධාන ප්‍රඥප්තිය වලංගු වූ දිනයෙහි ක්‍රියාත්මක වී ඇතැයි සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය. — සංශෝධනය අතීතයටත් බලපෑම.